## 2020/01/14 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2020/01/14 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩ්රආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 27. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2020.01.14 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. අද 2020 ජනවාරි මස 01 වැනිදා. මේ වසරේ පවත්වන පළවෙනි සභාව. ඒ අනුව මේ අවස්ථාවට සහභාගි වී සිටින ගරු උප සභාපතිතුමා ඇතුලු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා සියලු දෙනාම. මම ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. මම කවදත් බලාපොරොත්තු වෙන පරිදි සභාව ඉදිරියට කරගෙනයාමට. ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ වෙනත් කරුණු දැක්වීමේදී ගම් මායිම හරහා ඇති පාලම ලෙස සටහන් වී ඇතත්, එය පාලම නොව ගම් මායිම හරහා ඇති පාර ලෙස නිවැරදි විය යුතු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා පෙන්වා දෙන ලදී

**(අ)02. 2019.12.10 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.12.10 දින පැවති මහා සභාවේ සභා වාර්තාව, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා පෙන්වා දුන් සංශෝධනයන්ට යටත්ව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

ඉන් අනතුරුව පසුගිය සභා වාර්තාවේ සඳහන් වූ කුරුපනාව ගොවි සංවිධානය විසින් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම කර ඇත්තේ කුමක් සඳහාද යන්න ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විමසීමක් කරන ලද අතර ගරු සභාපතිතුමා විසින්, එම අත්තිකාරම මාපලගම වත්ත හරහා ඉදිවන පෝද්දිවල වතු මාර්ග සංවර්ධනය සඳහා ලබා ගත් බව පවසන ලදී.

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් 2020.01.08 දිනැතිව යොමු කරන ලද රා.ප.ච 25/2014 අනුව තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගෙන ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම ප්‍රදානය කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

02. ශ්‍රියානි කිරින්දගේ මිය, පුස්තකාලයාධිපති, උඩුගම මහජන පුස්තකාලය විසින් 2020.01.08 දිනැතිව යොමු කරන ලද උඩුගම මහජන පුස්තකාලයේ පවතින අඩුපාඩු සකස් කර දෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

03. විදුහල්පති, ගා/උනන්විටිය රේවත මහා විද්‍යාලය විසින් 2020.01.09 දිනැතිව යොමු කරන ලද 2020 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටියේ තණකොළ කපා සකස් කර ගැනීමටත්, ක්‍රීඩා උත්සවය පැවැත්වෙන 2020.02.06 දිනට ජල බවුසරයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළ ලිපිය සභාගත කරන ලදී.

04. ශ්‍රී මුත්තුමාරි අම්මන් කොවිල් කමිටුව විසින් වාර්ෂිකව පැවැත්වෙන කොවිල් උත්සවය සඳහා වතුර බවුසරයක් ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද 2020.01.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. විදුහල්පති, මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලය විසින් 2020 නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා 2020.02.07 දිනට වතුර බවුසරයක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර යොමු කරන ලද 2020.01.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

06. පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, නාගොඩ විසින් , නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් නාගොඩ කුරුපනාව මාර්ගයේ පවිත්‍රතාවය සම්බන්ධව යොමු කරන ලද 2020.01.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. උඩවැලිවිටිතලාව ප්‍රදේශවාසීන් විසින් උඩවැලිවිටියතලාව පොල්ලැව්වගොඩැල්ල වේල්ල සඳහා සිලිංඩර් 03 ක් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

08. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් තල්ගස්වල බදාදා සති පොළ සම්බන්ධව කේ.බී. අමල් මහතා , නව නගරය, තල්ගස්වල වෙත යොමු කරන ලද 2020.01.08 දිනැති ලිපියෙහි පිටපත සභාගත කරන ලදී.

09. අභියාචනා අංක 02/08/EPL/67/2019 ගාල්ල උඩුගම සාමිමලේ ලිපිනයෙහි ආර්.පී. ගුණදාස මයා විසින් පවත්වාගෙන යනු ලබන කලු ගල් කැඩීමේ කර්මාන්තය සම්බන්ධව ලබා ගන්නා ලද US-B 02199(RO) දරණ පරිසර ආරක්ෂණ බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ අභියාචනය විභාග කිරීම සම්බන්ධයෙන් පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය මගින් ආර්.පී.ගුණදාස මහතා වෙත යොමු කරන ලද 2020.01.08 දිනැති ලිපියෙහි පිටපත සභාගත කරන ලදී.

10. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) නඩත්තු කටයුතු පවරා දීම සම්බන්ධව යොමු කරන ලද 2019.12.31 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ඉදිකල යුතු මගී ආවරණ පිළිබඳ විස්තර ගබා ගැනීම සම්බන්ධව 2020.01.09 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12.ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් 218 උක්ඕවිට උතුර ග්‍රාම නිලධාරී වසමේ එක්සත් අන්‍යෝන්‍යාධාර සමිතියට අයත් පර්චස් 10 ක ඉඩම් කැබැල්ලක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව යොමු කරන ලද 2020.01.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

13. ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් උක්ඕවිට පෙරපාසල සම්බන්ධව යොමු කරන ලද 2020.01.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

14. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් දකුණු පළාත් සභා හිටපු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ සිලිංඩර් ලබා ගැනීම සම්බන්ධව 2020.01.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

15. ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් දකුණු පළාත් සභා හිටපු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ සිළිංඩර් ලබා ගැනීම සම්බන්ධව 2020.01.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

16. ආහාර පනතේ රාජකාරි ඉටු කිරීම සඳහා දැනට ලබා දෙන සුළු අක්මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් 2020 වර්ෂය සඳහා එක් වරකට රු. 3000.00 ක මුදලක් ලබා දෙන ලෙස ඉල්ලුම් කරමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක ජනිත ඩී ලියනආරච්චි මහතා, එච්.එල්.එන්.පී. කුමාර මහතා, එච්.ඩබ්.පී.අමරනාත් මහතා , යූ.කේ.ජයන්ත මහතා, යන මහත්වරුන් විසින් යොමු කරන ලද ලිපි සභාගත කරන ලදී.

17. නිල ඇඳුම් දීමනාව ලබා ගැනීම සම්බන්ධයෙන් රියදුරු අනුර දිසානායක මයා, රියදුරු එම්.ඒ.වසන්ත මයා, රියදුරු බී.ජී. පියතිලක මයා, කා.කා.ස. අවන්ත පද්ම මයා, කා.කා.ස. යූ.වී මධුර ප්‍රභාත් මයා, කා.කා.ස. ඩබ්.ඒ.සී. මධුෂානි මිය යන අය විසින් යොමු කරන ලද ලිපි සභාගත කරන ලදී.

18. එල්.එස්.ආර්විජේතිලක මයා, රිවර් පෙයාර්, නාගොඩ විසින් නාගොඩ කැකුලු පෙර පාසල සම්බන්ධව යොමු කරන ලද 2019.12.31 දිනැති ලිපිය සභාගත කරන ලදී.

19. කළමනාකරණ සහකාර එන්.එච්.ඩී.නිරෝෂනී මිය විසින් ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා අවශ්‍ය මුද්‍රිත ලේඛන මිළදී ගැනීම සම්බන්ධ 2020.01.08 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

20. පී.ඩී. යුරේකා මල්කාන්ති මහත්මිය, සංවර්ධන නිලධාරී විසින් 2020 අභ්‍යන්තර විගණන සැලැස්ම සභාගත කරන ලදී.

21. පළාත් පාලන දෙපාර්තමේන්තුව, ගාල්ල විසින් 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධව 2020.01.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

22. නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4(අ) 1 වගන්තිය යටතේ ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව 2019.12.18 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

23. අංක L36 දරණ නඩුව සම්බන්ධව එස් ප්‍රියන්ත විදානගේ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ උසාවි කොමසාරිස් තැන විසින් 2020.01.08 දිනැතිව යොමු කරන ලද දැන්වීම සභාගත කරන ලදී.

24. මානම්පිට, තල්ගස්වල, සුනිල් විතානාච්චි මහතා විසින් මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදු කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් අනතුරුව ලබා දී ඇති කොන්දේසි ගල් කොරිය හිමිකරු විසින් ඉටු නොකිරීම හා එම උල්ලංඝනයන්ට එරෙහිව පරිසර අධිකාරිය ක්‍රියා කිරීමෙන් වැළකීම පරිසර බලපත්‍රය අත්හිටුවීමට පියවර නොගැනීම, භූවිද්‍යා හා පතල් කාර්යාංශය විසින් ඛණිජ ද්‍රව්‍ය පනතේ නේදේසි උල්ලංඝනය කර රොක් බ්‍රේකර් යන්ත්‍ර භාවිතයට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව 2020.01.02 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

i. ප්‍රාදේශීය සභාව මගින් මාර්ග සංවර්ධන කටයුතු කිරීමේදී ගැටළු පැණ නැගෙන බැවින් මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග මොනවාද යන්න දැන ගැනීම සඳහා පළාත් සභාවෙන් හා මධ්‍යම රජයෙන් විමසීම් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

ii. ප්‍රධාන මංසන්ධි ආලෝකකරණය සඳහා 100 w,150w LED වීථි පහන් කට්ටල සවි කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

iii. රැස්වීම් ශාලාවට යාබදව ඉදි කර ඇති භාවිතා නොකරන වැසිකිලිය ඇති ස්ථානය විවේකාගාරයක් බවට පත් කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

iv. සේවක සුභසාධනය සඳහා අයවැයෙන් වෙන් කර ඇති රු. 100000.00 ක මුදල වියදම් කිරීම සඳහා යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

v. සභා රැස්වීමේ හඩපටය ශ්‍රවණය කිරීම සඳහා හෙඩ්පෝන් (හෙඩ් සෙට්) ලබාදීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

vi. එල්.එස්.ආර්.විජේතිලක මයා, රිවර් පෙයාර්, නාගොඩ විසින් නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යාම වෙනුවෙන් ගෙවන බදු මුදල වැඩි කර දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව 2020 වර්ෂයේ සිට එම බදු මුදල රු. 500.00 කින් වැඩි කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

vii. කළමනාකරණ සහකාර එන්.එච්.ඩී.නිරෝෂනී මිය විසින් ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා අවශ්‍ය මුද්‍රිත ලේඛන මිළදී ගැනීම සම්බන්ධව යොමු කර ඇති ඉල්ලීම අනුව අදාළ ආයතනය මගින් මුද්‍රිත ලේඛන මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා ස්ථිරකිරීමෙන් අනතුරුව ඒකමතිකව සහා සම්මත විය.**

viii. **පහත සඳහන් අංක 01 සිට අංක 17 දක්වා ආවරණ අනුමැතිය යටතේ සිදුකල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට යෝජනා කරමි.**

**2020.01.14 දින පැවැත්වෙන මහ සභාව සඳහා ඉදිරිපත් කල යුතු ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් පිළිබඳ විස්තරය**

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. සුළු අක් මුදල් බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම (2019.12.30) - රු. 2800.00
ii. සුළු අක් මුදල් බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම ( 2019.12.18) - රු. 2815.00
iii. 2020 වර්ෂය සඳහා අවශ්‍ය ඇමතුම් දිනපොත් සහ දින දර්ශන මිළදී ගැනීමේ අත්තිකාරම් මුදල - රු. 5000.00

**02. ලේකම්, ධීවර අමාත්‍යාංශය**

නාගොඩ සංවර්ධනගමවත්ත මාර්ග සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා වැඩිපුර ලැබී ඇති මුදල් නැවත යොමු කිරීම - රු. 6358.23

**03. දර්ශි චින්තනමාලි රූපතුංග ඇපා මිය ( ගරු ආණ්ඩුකාරතුමාගේ වැය අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලදී.)**

2019.12.17 දින පැවති සාහිත්‍ය නිර්මාණ උළෙලේ ශබ්ද විකාශන යන්ත්‍ර, වේදිකා ආලෝකකරණය සහ ප්‍රවාහනය සඳහා දරන ලද වියදම පියවීම - රු. 9500.00

**04. ජේ.එච්. සමීර මයා ( ගරු ආණ්ඩුකාරතුමාගේ වැය අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලදී.)**

2019.12.17 දින පැවති සාහිත්‍ය නිර්මාණ උළෙලේ සංග්‍රහ කටයුතු සඳහා ලබාගත් බීම කප් සඳහා මුදල් ගෙවීම - රු. 5580.00

**05. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ ( ගරු ආණ්ඩුකාරතුමාගේ වැය අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලදී.)**

2019.12.17 දින පැවති සාහිත්‍ය නිර්මාණ උළෙලේ සංග්‍රහ කටයුතු සඳහා ලබා ගත් ද්‍රව්‍ය වෙනුවෙන් ගෙවීම - රු. 4421.10

**06. සමන්තා හොටෙල්, මාපලගම ( ගරු ආණ්ඩුකාරතුමාගේ වැය අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලදී.)**

2019.12.17 දින පැවති සාහිත්‍ය නිර්මාණ උළෙලේ සංග්‍රහ කටයුතු සඳහා ලබා ගත් මාළු පාන් 300 සඳහා ගෙවීම - රු. 6600.00

**07. හෙල බොජුන්හල, යටලමත්ත ( ගරු ආණ්ඩුකාරතුමාගේ වැය අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලදී.)**

2019.12.17 දින පැවති සාහිත්‍ය නිර්මාණ උළෙලේ සංග්‍රහ කටයුතු සඳහා ලබා ගත් කට්ලට් සඳහා ගෙවීම - රු. 1600.00

**08. පෝස්ට් මාස්ටර් ජනරාල්, ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව**
2019 නොවැම්බර් මස තැපැල් ගාස්තු ගෙවීම - රු. 7000.00

**09.** **ටී.පී.ජී. ගුරුගේ ආනන්ද උපසිරි නානායක්කාර මයා, උඩුගම**

ජල නළ එළීම සහ මාර්ග පළුදු කිරීම වෙනුවෙන් රඳවා ගත් මුදල් නිදහස් කිරීම - රු. 1000.00

**10.** **ඩී.එන්.ඩී. පලිහවඩන මිය**

ආදායම් පරීක්ෂක ලෙස කටයුතු කරන ලද ඩී.එන්.ඩී. පලිහවඩන මහත්මියගේ ස්ථිර ඇප තැන්පතු මුදල් නිදහස් කිරීම - රු. 7826.96

**11.** **ඩැනී නාගොඩගමගේ මයා, උඩුගම**

මහජන පුස්තකාල තුන සඳහා ලබා ගත් පොත් වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 1800.00

**12.** **සරසවි පොත්හල, ගාල්ල**

පුස්තකාල තුන සඳහා පොත් වර්ග කිරීමට අවශ්‍ය ඩීවි දශම වර්ගීකරණය 23 සංස්කරණය පොත් මිළදී ගැනීම සඳහා ගෙවීම් කිරීම - රු. 2167.50

**13.** **එන්.එච්.ඩී.නිරෝෂනී කාන්ති මිය,නාගොඩ ප්‍රාදේශීය සභාව**

A3 පැකට් එකක් ලබා ගැනීමේ බිල්පත් මුදල් පියවීම - රු. 1580.00

**14.** **ඒ.ඩී. කරුණාරත්න මයා, යටලමත්ත**

2019 නොවැම්බර් මස නාගොඩ මහජන පුස්තකාලයට පුවත්පත් ලැබීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 6900.00

**15.** **එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

2019 දෙසැම්බර් මස උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම් - රු. 6370.00

**16.** **මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම**

2019 නොවැම්බර් මස විදුලි බිල්පත් ගෙවීම

තල්ගස්වල ප්‍රාදේශීය සභා පෙර පාසල (ගි.අ. 2813189405) - රු. 349.80

දීප්ති පෙර පාසල (ගි.අ. 2810125104) - රු. 313.20

**17.** **ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

**දුරකථන බිල්පත් ගෙවීම** (2019.11.01 - 2019.11.30)

i. 091 2296433 - ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම - රු.5640.46
ii. 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම - රු. 4652.36
iii. 0912231201 - සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - රු. 3825.54

**ආවරණ අනුමැතිය යටතේ සිදු කල ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

ix. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 30 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

**2020.01.14 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම්**

## වාර්තාව.

**01.2019 දෙසැම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 441.30 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල (පසුගිය මාසවල හිඟ බිල්පත්) | - රු. 2652.15 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු. 1502.70 |
| 8619142704 | - රන් කැකුළු පෙර පාසල | - රු. 514.50 |
| 4501090200 | - මාපලගම වෙළඳ සංකීරණ කොරිඩෝව | - රු. 349.80 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 935.40 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 258.30 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සි**

**දුරකථන බිල්පත් ගෙවීම** (2019.12.01 - 2019.12.31)

| | | |
|---|---|---|
| iv. | 091 2296433 - ප්‍රධාන කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු.6565.46 |
| v. | 0912296537 - සභාපති නිල කාමරයේ දුරකථන බිල්පත පියවීම | - රු. 3821.01 |
| vi. | 0912296577 - මාපලගම උප කාර්යාලයේ දුරකථන බිල්පත පියවීම | - රු. 422.98 |

**03.සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 -උප සභාපති නිවසේ දුරකථන බිල්පත පියවීම - රු. 613.01

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.12.25) - රු. 61.30

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

| | | |
|---|---|---|
| 33/53/003/008/11 | - උඩුගම උප කාර්යාලය (2019.11.20 – 2019.12.22) | -රු. 2700.20 |
| 33/53/003/009/10 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය (2019.11.20- 2019.12.20) | -රු. 419.75 |

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. තාක්ෂණික කමිටු නිලධාරීන් සඳහා දීමනා ගෙවීම - රු. 3500.00

**07. අතිකාල දීමනා ගෙවීම**

**2019 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 7680.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු. 9754.13 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු. 8360.00 |
| යූ.ජී. උපනාම මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1035.50 |

| | | |
|---|---|---|
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 546.59 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 654.06 |

**<u>08 .2019 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**<u>09. 2020 ජනවාරි මස ගමන් වියදම්</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 490.00 |

**<u>2019 දෙසැම්බර් මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - ගරු සභාපති | -රු. 6000.00 |
| සී.දයාවංශ මිය | -ලේකම් | - රු. 500.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | -රු. 4200.00 |
| යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | -රු. 400.00 |
| චන්දිමා සෙනෙවිරත්න මිය | - කළමනාකරණ සහකාර | -රු. 350.00 |
| අයි.චතුරි චින්තිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 400.00 |
| ප්‍රිමාලි ශ්‍රීනිකා මිය | - කළමනාකරණ සහකාර | - රු. 350.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 4010.00 |
| මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 700.00 |

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>

| | | |
|---|---|---|
| කේ.ජී මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 980.00 |
| කුසල් එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 1234.00 |

**<u>2019 නොවැම්බර් මස ගමන් වියදම්</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 1384.00 |

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>

**<u>2019 දෙසැම්බර් මස ගමන් වියදම්</u>**

<u>පුහුණු වැඩසටහන් සඳහා</u>

| | | |
|---|---|---|
| එන්.එච්.ඩී. නිරෝෂනී මිය | - කළමනාකරණ සහකාර | - රු. 876.00 |

**10. චන්ද්‍රිකා දයාවංශ මිය, නාගොඩ ප්‍රාදේශීය සභාව**

නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් වැටුප් ලබා ගැනීම - රු. 4200.90

**11. දිලිනි දිසානායක මිය, නාගොඩ ප්‍රාදේශීය සභාව**

නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් වැටුප් ලබා ගැනීම - රු. 8820.90

**12. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10355.00

**13. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2019 දෙසැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 311 ක් | - රු. 32240.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 190 ක් | - රු. 19760.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 200 ක් | - රු. 20800.00 |
| චේන්සෝ සහ තණකොළ කපන යන්ත්‍ර සඳහා | |
| පෙට්‍රල් ලීටර් 25 | - රු. 3425.00 |
| 2 ටී ඔයිල් ලීටර් 01 | - රු. 620.00 |
| - | |
| එකතුව | **- රු.139245.00** |

**14.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2020 ජනවාරි මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2019 දෙසැම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2205.00

**15. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජනවාරි මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**16. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 දෙසැම්බර්) - රු.13000.00

**17. මාල්බෝ ට්‍රේඩිං කම්පැනි, කොළඹ 03**

විදුලි කාර්මික මහතාගේ කටයුතු සඳහා අවශ්‍ය ෆයිබර් ග්ලාස් ඉණිමඟක් ලබාගැනීමේ බිල්පත - රු.70200.00

**18. දයානි පුද්.සමාගම, මාපලගම**

i. ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරය අළුත්වැඩියා කිරීමට අදාළ උපකරණ ලබා ගැනීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම - රු. 1994.00

ii. කසල ඉවත් කිරීමේ කටයුතු සඳහා සවලක් ලබා ගැනීමේ බිල්පත - රු. 600.00

**19. ලේකම්, ධීවර අමාත්‍යාංශය, ලබුදූව, ගාල්ල**

තල්ගස්වල වත්ත කෝවිල මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩිපුර ලැබී ඇති මුදල් නැවත යොමු කිරීම - රු.14980.03

**20. සඳුන් චතුරංග මයා, ඊ බේස් කම්පියුටර් ටෙක්නොලොජී, මාපලගම**

ප්‍රධාන කාර්යාලයේ පරිගනක සඳහා ටෝනර් ලබා ගැනීමේ බිල්පත් - රු. 50250.00

**21. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

i. LL 7650 කෘ කැබ් රථයේ ටයර් රෝඩ් ගැලවී ඇති බැවින් එය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 34348.00

ii. LL 7650 කෘ කැබ් රථයේ බ්‍රේක් පද්ධතිය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 1850.00

**22. සිසිර ජයමාන්න මයා, පොලිසිය අසල, උඩුගම**
2019 දෙසැම්බර් මස 10 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත
(කෑම සහ තේ සඳහා) - රු. 5035.00

**23. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු. 20930.00

**24.දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම**
පී. සෙව්වන්දි මනම්පේරි මිය -රු. 314850.00

25. ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී
දුරකථන බිල්පත් ගෙවීම - 2019 දෙසැම්බර්
සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම - 0912231201 - රු. 4119.80

**රජයේ ආධාර**
**පළාත් නිශ්චිත - සංවර්ධන ප්‍රදාන**
**26. මාමණ්ඩොල ප්‍රජා මූල සංවිධානය, නාකියාදෙණිය, ගාල්ල**
යටලමත්ත මාමණ්ඩොල වතු මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය
10% රැඳවුම් මුදල ගෙවීම - රු. 99317.43

**27. කුරුපනාව ගොවි සංවිධානය, කුරුපනාව**
තල්ගස්වල වත්ත කොවිල වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ මුදල් ගෙවීම - රු.886517.98

**28.ග්‍රාමීය හා වතු මාර්ග සංවර්ධනය**
මාපලගම වත්ත හරහා දිවෙන මලාමුර පෝද්දිවල මාර්ගය සංවර්ධනය කිරීම - රු. 1977751.04

**උපමාන පාදක සංවර්ධන ප්‍රදාන**
29.ඇඩ්ලින් මයාගේ නිවසේ සිට ජයවීර මහතාගේ නිවස දක්වා වූ ගඟ අද්දර මාර්ගය
මීටර් 100 ක් පමණ කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම - රු. 727747.77

**30. ලේකම්, ධීවර අමාත්‍යාංශය**
මලාමුර පෝද්දිවල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැඩිපුර ලැබී මුදල්
නැවත යොමුකිරීම - රු.22248.96

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ගෙවීම් ගරු සභාව විසින් පිලිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

(ඉ) 2. **ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**2.1.** **ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උනන්විටිය ග්‍රාම සේවක කොට්ඨාසයට අදාළව ඇති රාජ්‍ය නිලධාරී කාර්යාල පවත්වාගෙන යාම සඳහා පොළ භූමිය අසළ ඇති සිරිසේන අරුක්ගොඩ මහතාට අයත් ඉඩම ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.
ii. උනන්විටිය ප්‍රාථමික විද්‍යාලය සහ මහා විද්‍යාලය ස්ථාන දෙකක පවත්වාගෙන යාම දරුවන්ට අවහිරතා ඇති වන බැවින් උනන්විටිය ප්‍රාථමික විද්‍යාලය හා මහා විද්‍යාලය එක්කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ ඉහලගම සහ ජනසවිය ගම්මානයත්,ගුලනකන්ද ගම්මානයත් යා වන ලෙස ආනන්ද විජය විදුහල අසළ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර අතරමග ඉදිකිරීම් කටයුතු නතර වී ඇති පාලම පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සහ මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර මෙම පාලමේ ඉදිරි ඉදිකිරීම් කටයුතු නිම කර දීමට පියවර ගන්නා ලෙස යෝජනා කරමි.
ii. ග්‍රාම සංවර්ධන සමිතිය 218 උඩුගම දකුණ මගින් මා වෙත කර ඇති ඉල්ලීමට අනුව උඩුගම දකුණ ග්‍රාම නිලධාරී වසමේ උඩුගම මූලික රෝහල අසල ගාල්ල - උඩුගම ප්‍රධාන මාර්ගයට යාබදව පිහිට පැරණි ග්‍රාම සංවර්ධන ගොඩනැගිල්ල පිහිටි ඉඩම සභාවට පවරා ගන්නා ලෙස යෝජනා කරමි.
iii. උඩුගම නැගෙනහිර, දකුණ හා මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම්වල රාජ්‍ය නිලධාරීන් මේ වන විට කාර්යාල කටයුතු සිදු කරනු ලබන්නේ බදු පදනම මත ලබා ගත් පෞද්ගලික ස්ථානවල බැවින් මේ පිළිබඳව නාගොඩ ප්‍රාදේශීය ලේකම්තුමියගේ අවධානය යොමු කොට උඩුගම දකුණ සහ උඩුගම මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් දෙකම ඒකාබද්ධ වන පරිදි ප්‍රමාණවත් පහසුකම් සහිත එක් නිල සෙවන ආයතනයක්ද, උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම සඳහා එක් නිල සෙවන ආයතනයක්ද ඉදි කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. උඩවැලිවිටිතලාව කොට්ඨාසයේ උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල මාර්ගය, උඩවැලිවිටිය අන්නාසිගලදෙනිය මාර්ගය, උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල ගුණපාල මහතාගේ ඉඩම අසළ සිට කොන්ඩුගොඩ දක්වා මාර්ගය, උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල පිටුවල මාර්ගය යන මාර්ග මැණුම් නියෝගයක් මගින් සීමා මායිම් වෙන් කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් හරහා කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී ගයාන් මදුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. මලාමුර ප්‍රාථමික විද්‍යාලය නාගොඩ රාජකීය ජාතික පාසලේ පෝෂක පාසලක් ලෙස අනුමත කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් මදුසංඛ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**පෙර පාසල් නිල ඇඳුම් සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම**

| විස්තරය | **ලෝරන්ස් ෆැෂන්, උඩුගම** | **සිංහගිරි ස්ටෝර්ස්, උඩුගම** | **මහේන්ද්‍ර ලොරෙන්සුහේවා, මාගාල්ල** |
|---|---|---|---|
| පෙර පාසල් නිල ඇඳුම් ගැහැනු නිල ඇඳුම | රු. 750.00 | රු. 790.00 | රු. 810.00 |
| පිරිමි නිල ඇඳුම | රු. 750.00 | රු. 800.00 | රු. 800.00 |

**පෙර පාසල් නිල ඇඳුම් සැපයීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ලෝරන්ස් ෆැෂන්, උඩුගම වෙතින් පෙර පාසල් නිල ඇඳුම් ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

i. 2019.12.27 දින පැවති ප්‍රසිද්ධ වාහන වෙන්දේසිය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2019 දෙසැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 දෙසැම්බර් මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2019 දෙසැම්බර් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා ජනවාරි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. පළමුව ලැබුවා වූ නව වසර සියළු දෙනාට වාසනාවන්ත සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.පළමුවෙන්ම මම මාගේ බාප්පාගේ මළ ගෙදරට සහභාගී වූ මන්ත්‍රීතුමන්ලා ඇතුළු සියළු දෙනාට ස්තූතිය පුද කරන අතර, ගරු සභාපතිතුමන්ට මළ ගෙදර සිදු වූ අවස්ථාවේ එම ස්ථානයට වීථි පහන් සවි කර දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් කරන ලද ඉල්ලීමට අනුව කඩිනමින් එම වීථි පහන් සවි කිරීම වෙනුවෙන් මාගේ ස්තූතියත් මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම එතනදී මගේ හිතේ පොඩි කණගාටුවකුත් තියෙනවා. මොකද, වීථි පහන් සවි කිරීමට වාහනය සහ සේවකයන් ආවත් ඒ සඳහා අවශ්‍ය කරන උපකරණ ගෙන ගොස් තිබුනේ නැහැ. වාහනයේ තිබුනේ බල්බ් එකක් පමණයි. එවිට මම අවශ්‍ය උපකරණ ලබා දීලා තමයි අවශ්‍ය ස්ථානයන්ට වීථි පහන් සවි කරගත්තෙ. මේ

කාරණය මම කිව්වෙ මගේ බාප්පගෙ මළ ගෙදර නිසා නෙවෙයි. අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල යම් කිසි දුප්පත් පුද්ගලයෙකුගෙ ගෙදරක මළ ගෙදරක් සිදු වු විට ඔහුට තමන්ගේ වියදමින් අවශ්‍ය විදුලි ආලෝකය සපයා ගැනීමට නොහැකි අවස්ථාවල විදුලි ආලෝකය සපයා දීම ප්‍රාදේශීය සභාව සතු යුතුකමක් ලෙස තමයි මම දකින්නෙ. ඉදිරියෙදි එවැනි අවස්ථාවකදී ඒ සම්බන්ධව සළකා බලා කටයුතු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, තවත් කාරණයක් තමයි. මේ සැරේ තල්ගස්වල පුරන් වෙච්ච කුඹුරු සහිත ගොවි මහත්වරු විසින් බොහොම අමාරුවෙන් වැඩ කරලා, මේ වන විට පැල ගොයම තියෙන්නෙ. කියන්න කණගාටුයි තල්ගස්වල නුග ගහ අසළ පැල ගොයම තියෙන කුඹුර පස් දාලා මේ වන විටත් ගොඩකරමින් පවතිනවා. මේ සම්බන්ධව සොයා බලා පරීක්ෂණයක් කර ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, කටුපොල් සම්බන්ධව කතා කරනවානම් පසුගිය කාල වකවානුව තුල කටපොල් වගා කිරිම සම්බන්ධව යම් යම් ක්‍රියාමාර්ග ගත්තත් මේ වන තෙක් කටුපොල් වගාව නතර වෙලා නැහැ. ඒ වගේම එම කටුපොල් කර්මාන්තය තුල සේවය කරන සේවකයනුත් යම් යම් අපහසුතාවයන්ට පත් වෙනවා. ඒ වගේම කටුපොල් කර්මාන්තශාලාවට සභාවෙන් පරිසර බලපත්‍රයක් නිකුත් කරනවද? නිකුත් කරලා තියෙනවාද කියලා මම දැනගන්න කැමතියි. අවසාන වශයෙන් ලැබුවා වූ 2020 වර්ෂය සියළු දෙනාට ජය, සතුට සපිරි නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුව ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනී, විශේෂයෙන්ම කියන්න ඕන. උඩුගම ශාසනාලංකාරාරාමය මගින් වාර්ෂිකව පවත්වනු ලබන බෝධිරාජ මහා පෙරහැර මෙවරත් මෙම මස 25 වන දින වීථි සංචාරය කිරීමට සියළු කටයුතු සූදානම් කරලා තියෙනවා. පෙරහැර කමිටුව මගින් මගෙන් පෞද්ගලිකවත්, ප්‍රාදේශීය සභාවට ලිපියක් මගිනුත්, ශ්‍රී ගුණානන්ද මාවත දෙපස එළිපෙහෙළි කර දෙන ලෙසත්, අවශ්‍ය ස්ථානවල වතුර බවුසර් ස්ථානගත කර දෙන ලෙසත්, උඩුගම මහා විද්‍යාලයේ හා ප්‍රාථමික විද්‍යාලයේ එක් රැස් වන කැලී කසල ඉවත් කර දෙන ලෙසත්, වීථිපහන් සවි කර මාර්ග ආලෝකකරණය කර දෙන ලෙසත්, ආදී වශයෙන් ඉල්ලීම් කරලා තියෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. හෙට දිනයේ පුළුවන් නම් කම්කරුවන් යොදවලා, ශ්‍රී ගුණානන්ද මාවත එළිපෙහෙළි කරලා දෙන්න කියලා.

ඒ වගේම උඩුගම උසාවිය හංදියේ සිට උඩුගම ඩිපෝව දක්වා සහ ගුණානන්ද මාවතේ විහාරස්ථානය දක්වා මාර්ගයේ දැනට අක්‍රීය වී ඇති වීථි පහන් හේතුවෙන් මේ මාර්ගය අඳුරු ස්වභාවයක් ගන්න අතර පෙරහැර කාලසීමාව තුලදී එයින් ජනතාව දැඩි අපහසුතාවයකට පත් වන බැවින් මේ වන විට අක්‍රීය වෙලා තියෙන වීථි පහන් ටික පෙරහැර පවත්වන්නට පෙර හැකි ඉක්මණින් අළුත්වැඩියා කර දෙන ලෙසත්, මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම පෙරහැර කමිටුව මීට අමතරව පෙරහැර වීථි සංචාරය කිරීමෙන් අනතුරුව පෙරහැර ගමන් කරන ලද මාර්ගයේ හා උඩුගම මහා විද්‍යාලයේ උඩුගම ප්‍රාථමික විද්‍යාලයේ එක් රැස් වී ඇති කැලි කසළ ඉවත් කිරීම් කර දෙන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින අතර, ජනවාරි 24 සහ 25 දිනවල පානීය ජල බවුසර් ලබා දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමින් ඔබ සැමට සුභ නව වසරක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුව ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, මට දැනගන්න ඕන එකම කාරණයයි අපි මාපලගම නගරය පිරිසිදු කරන්න අරගත්තු පුද්ගලයාගේ වයසෙ ප්‍රශ්නයක් තියෙනවද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුව ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, උඩුගම අපේ ශ්‍රවනාගාරයේ උත්සවයකට සහභාගී වී සිටින අවස්ථාවෙ වේදිකාවෙ තිර රෙද්ද කඩා ගෙන බිමට වැටුණා. ඇත්තටම එවෙල අපට ප්‍රාදේශීය සභා නියෝජිතයන් වශයෙන් අපි දැඩි අපහසුතාවයකට පත් වුණා. මොකද මේක අපේ ආයතනයක් නිසා. සමන් මන්ත්‍රීතුමත් මේ අවස්ථාවට සහභාගි වෙලා හිටියා. මේ ගැන එතුමත් ප්‍රකාශ කළා. එබැවින් ගරු සභාපතිතුමනි, මේ ශ්‍රවනාගාරයේ තිර රෙදි ක්‍රමානුකූලව සකස් කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගමට තියෙන එකම මෙහෙනි ආරාමය වන කටුකිතුලංගල ආරාමය තියෙන්නෙ උඩුගම මධ්‍යම. ආරාමය අවට ගෙවල් 10ක් විතර තියෙනවා. ඒ ප්‍රදේශයට නිරන්තරයෙන් දැඩි අකුණු සැර වැදීමේ ප්‍රවණතාවයක් තියෙනවා. ඒ හේතුව නිසා මේ වන විට මේ ආරාමයටත් කිහිප අවස්ථාවකදී අකුණු සැර වැදීම හේතුවෙන් විදුලිය විසන්ධි වෙලා තියෙනවා. ඒ හේතුවෙන් ජලය ලබා ගැනීමටත් නොහැකි වෙලා තියෙනවා. ජලය හා විදුලිය නොමැති නිසා මේ වන විට එහි වැඩ විසු මෙහෙණින් වහන්සේ ආරාමය අතහැර ගොස් තියෙනවා. නමුත් මේ ගැටළු විසඳා දෙනවනම්, මෙහෙණින් වහන්සේ නැවත ආරාමයට වැඩම කිරීමට කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නෙ අදාළ ආයතන දැනුවත් කර එම පහසුකම් සළසා දීමට අවශ්‍ය කටයුතු සළසා දෙන්න කියලා. මොකද උඩුගමට තියෙන එකම මෙහෙණි ආරාමය මෙය වන නිසා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් සහ මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. පළමුව ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට ජය, සතුට පිරි සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගෙවී ගිය වසර තුල අපි සියළු දෙනා සභාවේ ඉදිරි දැක්ම පිළිබඳ පක්ෂ, විපක්ෂ නොතකා කටයුතු කරමින් ඉතා සුහදශීලී ගමනක් ගිය අතර, ලැබුවා වූ නව වසරෙත් එසේ සියළු දෙනා එකට එක්ව කටයුතු කරමින් සාර්ථක සභාවක් ලෙස ඉදිරියට පවත්වා ගෙන යාමට ආරාධනා කරන අතර ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මැතිතුමාගේ බාප්පාගේ අවමංගල්‍යය පිළිබඳ දැනුවත් නොවූ බැවින් ඒ සඳහා අද දවසේත් සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටින අතර, දැනුවත් නොවීම නිසා අවමංගල්‍යයට සහභාගි වීමට නොහැකිවීම පිළිබඳ නැවතත් කණගාටුව ප්‍රකාශ කරමින් 2020 නව වසර සැම දෙනාටම වාසනාවන්ත අවුරුද්දක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. 2020 ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, වර්තමානයේ පැනනැගුනු ප්‍රධාන ප්‍රශ්නයක් විදියට කටුපොල් කර්මාන්තය ආශ්‍රිතව සේවය කරන වතු කම්කරුවන්ගේ ශ්‍රමය, වටවල වැවිලි සමාගමේ පාලන අධිකාරිය විසින් අසාධාරණ ලෙස සූරා කෑම පෙන්වා දෙන්න පුළුවන්. ඒ වගේම කටුපොල් කිරුම් මිණුම් කරන ක්‍රමවේදයේද සාධාරනත්වයක් නොමැතිවීම තවත් ලොකු ගැටළුවක්. මොකද කටුපොල් කිරන ක්‍රමය අමුතුම

ක්‍රමයක් වෙලා තියෙනවා. කර්මාන්තශාලාවට කටුපොල් ගෙනාවට පස්සෙ ඒ අතුරින් තොරාගත් කටුපොල් වල්ලක් කිරලා, එහි අගය අරගෙන ඊට්පස්සෙ එතන තියෙන කටුපොල් වලු ප්‍රමාණය ගණනය කරලා, කලින් කිරපු එකේ අගයෙන් වැඩි කරලා තමයි ගණනන හදන්නෙ. නාකියාදෙනිය කර්මාන්තශාලාවෙන් ඇඹරිය නොහැකි වැඩි කටුපොල් ප්‍රමාණය වෙනත් කර්මාන්තශාලාවකට රැගෙන ගිහින් නියම ක්‍රමවේදයට කිරුම් මිණුම් කරන කොට මෙහේදි ගණනය කල කිලෝ ගණනට වඩා වැඩි වන අවස්ථා තියෙනවා. එතනදිත් මෙම කම්කරුවන්ට වෙන්නෙ අසාධාරණයක්. ඔවුන්ට ගෙවන්නෙ මෙහේදි කිරලා ගණන් හදන ප්‍රමාණයට අනුව.

ඒවගේම ගරු සභාපතිතුමනි, සදරුස්ගම පාරේ පසුගිය වැසි සමයත් සමඟ මාර්ගයට පස් කණ්ඩි කඩා වැටිලා, කාණු අවහිරවෙලා. දැන් ඒ පස් ගොඩවල් උඩ මිනිස්සු ගහල, එළවළු ආදී වගා කටයුතු කරනවා. ඒවගේම කුණු ගොඩවල් ගෙනැල්ලා පාර දෙපසට දාලා කාණු අවහිර කරලා තියෙනවා. මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරියකු එවලා, සොයා බලා කටයුතු කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, උඩුගම මහජන ක්‍රීඩාංගණයේ පැවැත්වෙන සර්කස් සංදර්ශනය අපේ සභාවෙ නිල මුද්‍රාව නැති ටිකට්පත් අලවි කරනවා. මේ සඳහා අපේ නිලධාරීත් වග කිව යුතුයි. නිසි අධීක්ෂණයක් නොමැති නිසා මෙවැනි කටයුතු සිදු වෙනවා. දිනකට විශාල පිරිසක් මෙම සංදර්ශනය නැරඹීම සඳහා පැමිණෙන අතර, මෙවැනි සභාවේ නිල මුද්‍රාව නොමැති ටිකට්පත් අලවි වීම නිසා අපේ සභාවට ලැබිය යුතු ආදායම අඩුවෙනවා. ඒ නිසා මේ ගැන සොයා බලා නිසි අධීක්ෂණයකින් යුතුව මේ කටයුතු සිදු කරන ලෙසත්, සභාවට ලැබිය යුතු ආදායම් නිසි පරිදි ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනී, ගරු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියනි, ලැබුවා වූ නව වසර සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, වර්තමානයේ රටේ පවතින ආර්ථික තත්වය පිළිබඳ අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඌරල ප්‍රදේශයේ ඉදි කිරීමක් සිදු කිරීමේදී බැකෝ යන්ත්‍රයක් යොදා ගෙන එම ස්ථානයේ තියෙන ප්‍රාදේශීයසභාව සතු පොදු නාන ළිඳට විශාල හානියක් සිදු කරලා තියෙනවා. පැති බැම්මත්, ඉස්සරහ ළිං බක්කියත් කඩා විනාශ කරලා තියෙනවා. මේ සම්බන්ධව මම 09 වෙනි මාසෙ සභාවෙදි කථා කළා. නමුත් අද වෙනතුරු මේ ගැන නිලධාරියෙක් ගිහිල්ලා හෝ පරීක්ෂණයක් කරලා, නැහැ. ඉදිරියට එන්නෙ නියඟ කාලය. එම කාලයේදී මේ පොදු ළිඳ ඒ ප්‍රදේශයේ විශාල පිරිසක් භාවිතයට ගන්නා නිසා මේ සම්බන්ධව සොයා බලා ඉක්මන් පියවරක් ගන්නා ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේ ආසන්නයේ ඉදිකිරීම කරන පුද්ගලයා ඔබතුමා ඉදිරියෙදි මේ ළිඳ හොඳට සකස් කරලා දෙන ලෙස පොරොන්දු වුණා. නමුත් අද වෙනතුරු කිසිම දෙයක් කරලා නැහැ. තවමත් බැකෝ යන්ත්‍රය යොදා ගෙන කරපු හානිය ඒ ආකාරයෙන්ම තියෙන බැවින් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, තව කාරණයක් තමයි. බෝවිටියමුල්ල සිට තලාවට වැටෙන තලගහහේන මාර්ගය කාණුවක් අවහිර වන සේ ප්‍රියන්ත කියන පුද්ගලයා කොන්ක්‍රීට් බැම්මක් ඉදි කරමින් පවතිනවා. මේ සම්බන්දව මම සභාපතිතුමාට සඳුදා දුරකථනයෙන් දැණුම් දුන්නා. නමුත් මේ වෙනකම් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ඒ නිසා තාක්ෂණ නිලධාරීන් යොමු කර මේ

සම්බන්ධයෙන් සොයා බලා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් ලැබුවා වූ 2020 නව වර්ෂය සියළු දෙනාට සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. 2020 ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, මම මුලින්ම කියන්න ඕන. අපි මේ සභාවෙ කතා බහ කරන කරුණුවලට අදාළව එම කරුණු සම්බන්ධව යම් යම් ආයතන දැනුවත් කිරීම සඳහා ලිපි යොමු කර එහි පිටපතක් අපටද ලබා දෙන ලෙස අවුරුදු දෙක් පුරාවටම මම මේ සභාවෙ කතා කරලා තියෙනවා. නමුත් අද වෙනකම් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අරගනිපු බවක් පෙනෙන්නෙ නැහැ. මෙතන මේ කටයුතු සිදු වෙන්නෙ ලේකම්තුමියගේ අවශ්‍යතාවය මතද? එහෙම නැත්නම්, අපි මේ කියන කරුණුවලට සභාපතිතුමා අවධානය යොමු කරන්නෙ නැද්ද? කියන එක පිළිබඳව අපට ගැටළුවක් තියෙනවා. සභාවෙ කතා කරපු ගැටළුවක් සම්බන්ධව යම් ආයතනයක් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරලා, ඒ සම්බන්ධව අපිවත් දැනුවත් කරනවානම්, අපට පෞද්ගලිකව හෝ ඒ ආයතනවලට ගිහිල්ලා ඒ ගැන සොයා බැලීමේ හැකියාව තියෙනවා. ඒ සම්බන්ධව මේ අවුරුද්දෙ ඉඳලවත් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒවගේම තව දෙයක් කියන්න කැමතියි. අප ප්‍රාදේශීය සභාවෙන් පාලනව වන පෙර පාසල් අතර, ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසලක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් විදියට මම දකිනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසලක් අපේ ප්‍රාදේශීය සභාව මගින් ආරම්භ කරලා පවත්වාගෙන යනවනම් හොඳයි කියලා මම හිතනවා. ඒ සඳහා උක්ඕවිට පෙර පාසල සුදුසුයි කියලා මට හිතෙනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, හිනිදුම සිට තලගහ දක්වා මාර්ගය පුළුල් කර ඉදිකිරීමේ කටයුතු සිදු කර ගෙන යනවා.ඒ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී භාණ්ඩ ප්‍රවාහනය කරන බර වාහන ධාවනය වෙනවා. පසුගිය දිනක එම වාහනයක හැපිලා, ගෝණදෙනිය ප්‍රදේශයේ තරුණයෙක් ජීවිතක්ෂයට පත් වුණා. එබැවින් මෙම අනතුරු අවම කර ගැනීම සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත් සමාගම සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කරලා, කටයුතු කිරීමට පියවර ගන්න කියලා ඉල්ලා සිටිනවා. අනිත් කරුණ තමයි. කැටගොඩ හංදිය බස්නැවතුම්පල හා ඒ අවට ප්‍රදේශයේ පෞද්ගලික පංති පැවැත්වෙන අතර, එම පංතිවලට ළමුන් පැමිණෙන වේලාවට සහ පිටව යන වේලාවට කැටගොඩ බස් නැවතුම්පොළ හා ඒ අවට මාර්ගයේ විශාල පිරිසක් ගැවසෙනවා. පසුගිය දිනෙක පෞද්ගලික පංතියකය ළමයා ඇරලවන්න ආපු මවක්, ඇය පැමිණි බස් රථයටම යට වෙලා ජීවිතක්ෂයට පත් වුනා. එම ස්ථානයේ බස් නැවතුම්පල හා පාර අතර විශාල ඉඩ ප්‍රමාණයක් ඇති බැවිනුත්, අධික වේගයෙන් රිය ධාවනය කරන බැවිනුත් මෙවැනි අනතුරු සිදු වන බවත් එම අනතුරු අවම කිරීම සඳහා බස් නැවතුම්පොළ සීමාවේ වාහන ධාවනය කරන වේගය සීමා කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර බස් නැවතුම්පොළ දෙපසට මාර්ග බාධක( බම්පර්) දෙකක් ඉදිකිරීමට පියවර ගැනීමටවත් අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, ඉහළගම සහ දික්දොළ බස් රථ දෙක පසුගිය කාලයේ ධාවනය නොවී තිබුණා. අපි උඩුගම ඩිපෝව සමඟ සාකච්ඡා කරලා, ඒ බස් රථ දෙක නැවත් ධාවනය කරන්න අවශ්‍ය කටයුතු සිදු කළා. නමුත් දැන් නැවතත් එම බස් රථ අදාළ ගමනාන්ත දක්වා ධාවනය නොවන බව තමයි දැනගන්න තියෙන්නෙ. ඒකට හේතුව වෙලා තියෙන්නෙ පසුගිය දවස්වල උඩුගම ඩිපෝවෙ අධ්‍යක්ෂ මණ්ඩලය අලුතින් පත්වීම සහ කළමනාකරු වෙනස්වීමයි. වර්තමානයේ කළමනාකරු

අලුත් කෙනෙක්. මේ සම්බන්ධව ඩිපෝ කළමනාකරු දැනුවත් කරලා, අවශ්‍ය පියවර ගන්න කියලා මම මේ වෙලාවෙ ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පරිසරය ගැන හරි සංවේදී, පරිසරය ගැන හිතන කෙනෙක්. පරිසරය පිරිසිදුව තියාගන්න දැඩි උනන්දුවක් දක්වනවා. ඒ අනුව පසුගිය කාලයේ බැනර්, පෝස්ටර් ඉවත් කරලා, යම් වැඩකොටසක් කළා. නමුත් යම් මාධ්‍ය ආයතනයකින් පසුගිය දවසෙ සෑම තැනකම ලයිට් කණුවල බැනර් එල්ලලා තියෙනවා. එම බැනර් එකක්වත් ඉවත් කරන්න කටයුතු කරලා නැහැ. ඒ පිළිබඳවත් මම මේවෙලාවෙ මතක් කරනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මාසික සභා රැස්වීම පවත්වන්නට සතියකට කලින්වත් සභාපතිතුමා, ලේකම්තුමිය, තාක්ෂණ නිලධාරී ආදී නිලධාරීන් එකතු වෙලා කමිටුවක් හදාගෙන සභාවට ඉදිරිපත් කල යුතු ලිපි අත්‍යාවශ්‍යම ලිපි ලේඛන පමනක් ඉදිරිපත් කිරීමට කටයුතු රනවානම් හොදයි. මොකද ඔබතුමාත් සභා රැස්වීමට යොමු කරන ලිපි කියවනවා. අපිත් අහගෙන ඉන්නවා. කාලය ගතවෙනවා. සමහර වෙලාවට මෙතනට අදාළ නොවෙන ලිපිත් කියවනවා. ඒ නිසා ඒ ගැන සැළකිලිමත් වෙන්න. පසුගිය සභාවක වෙනත් සභාවකට අදාළ ලිපියකුත් ඉදිරිපත් කළා. ඒ නිසා කමිටුවක් පත්කරලා, සභාවට යොමු කරන්න ඕන ලිපි මොනවද කියලා තෝරලා බේරලා අත්‍යාවශ්‍යම ඒවා පමණක් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුවෙන්ම ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, ඉතා දීර්ඝ කාලයක් තිස්සේ කරන ලද ඉල්ලීමකට අනුව උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ ඉහලගම සහ ජනසවිය ගම්මානයත්, ගුලනකන්ද ගම්මානයත් යා වන ලෙස ආනන්ද විජය විදුහල අසලින් ඉදිකර ඇති පාලමේ වැඩ ආරම්භ කර දැනට වසර 4 ½ ක් පමණ ඉක්මගොස් ඇතත් මේ වන තෙක් එම පාලමේ වැඩ අවසන් කර නැත. මේ හේතුවෙන් ඉහත ගම්මාන දෙකෙහි පවුල් 200කට වඩා වැඩි සංඛ්‍යාවක් බලත් අසාධාරණයකට හා අපහසුතාවයකට පත්ව ඇත. මෙම ගම්මානයේ කිසිඳු සංවර්ධන කටයුත්තක් කල නොහැකිවීම හේතුවෙන් එකී ජනතාව දැඩි අපහසුතාවයකට පත්ව ඇත්තේ ඒ සඳහා ප්‍රෙවිශ විය හැකි කිසිදු ක්‍රමයක් නොමැතිවීමය. මෙම ගැටළුව පිළිබඳව මම මීට පෙරද මෙම ගරු සභාව දැනුවත් කලත් මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැත. එබැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුව හා මධ්‍යම රජයේ මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර අතරමග නතර කර ඇති මෙම පාලම ඉදිකිරීමේ කටයුතු නිම කර දීමට පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩුගම දකුණ ග්‍රාම නිලධාරී වසමේ උඩුගම මූලික රෝහල අසල ගාල්ල- උඩුගම ප්‍රධාන මාර්ගයට යාබඳව පිහිටි පැරණි ග්‍රාම සංවර්ධන ගොඩනැගිල්ල අබලන්ව ඇති අතර මෙම ස්ථානයේ සංවර්ධන කටයුතු කිරීමේදී එම ඉඩම සභාව සතු නොවීම හේතුවෙන් ගැටළු මතු වී ඇත. එම ඉඩම සභාවට පවරා ගෙන සංවර්ධන කටයුතු කරන ලෙස ග්‍රාම සංවර්ධන සමිතියේ නිලධාරී මණ්ඩලය මා වෙතින් ඉල්ලීමක්ද කර ඇත. මෙම ස්ථානය මවිසින් ස්ථානීය නිරීක්ෂණයකට ලක් කර අතර ස්ථානීය වශයෙන් මෙම ඉඩමේ පිහිටීම ඉතාම වැදගත් වන බැවින් මෙම ඉඩම සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය තමයි, ගරු සභාපතිතුමනි, උඩුගම දකුණ හා උඩුගම මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම්වල සියළු රාජ්‍ය නිලධාරීන් මේ වන විට කාර්යාලීය කටයුතු කරනු ලබන්නේ පෞද්ගලික හිමිකරුවන්ගෙන් බදු පදනමට ලබා ගත් කාර්යාලවලයි. සේවාවන් ලබා ගැනීමේදී විවිධ ස්ථානවලට

යාමට සිදුවීම හා තවත් අපහසුතා නිසා මෙහි ජනතාව අපහස්තාවයට පත්ව ඇත. එබැවින් මේ පිළිබඳව නාගොඩ ප්‍රාදේශීය ලේකම්තුමියගේ අවධානය යොමු කොට උඩුගම දකුණ හා උඩුගම මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් දෙක ඒකාබද්ධ වන පරිදි ප්‍රමාණවත් පහසුකම් සහිත එක් නිල සෙවන ආයතනයක්ද, උඩුගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම සඳහා එක් නිල සෙවන ආයතනයක්ද, ඉදි කරදීමට කටයුතු සළසා දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙමි. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. 2020 ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, පරණතානායම්ගොඩ මගේ කොට්ඨාසය තුල කුඹුරු අක්කර 50 ක් විතර පසුගිය කාලයේ පුරං වෙලා තිබුණා. එහෙම පුරං වෙන්න හේතුව වුනේ වීරසිංහ මහතා නොහොත් කවුරුත් කියන විදියට යකා මහත්තයා ඒ කුඹුරුවලට වතුර ගන්න ඇළ මාර්ගය අවහිර කරලා ඉදි කිරීමක් කරලා තිබුන නිසා. මම එවකට ගොවි සංවිධානයේ සභාපති හැටියට මේ පුරං කුඹුරු ටික අස්වද්දන්න ඇළේ අවහිරතාවය ඉවත් කරගන්න නොයෙක් අරගල කළා. පසුව බැරිමතැන මම උපවාසයක් කරලා බොහොම අමාරුවෙන් අවහිර කරපුවා ඉවත් කරලා කුඹුරු අක්කර 50 ක් විතර අස්වැද්දීමට අවශ්‍ය කටයුතු කළා. නමුත් දැන් නැවතත් ඒ ඇළ අවහිර කරලා කෙසෙල් කොරටුවක් හදලා පොල් අතුවලින් අහුරලා තියෙනවා. ඒ හේතුව නිසා නැවතත් ඒ කුඹුරු ටික පුරං වෙලා තියෙනවා. පසුගිය දවසක රාත්‍රියේදි කවුරුහරි ඒ අහුරපු පොල් අතු වැටට ගිනි තියලා. ඒකට මාව සැකකරලා දයානන්ද වීරසිංහ මහත්තයා පොලීසියෙ පැමිණිල්ලක් දාලා ගිණි තිබ්බෙ මමයි කියලා. ඒකෙ පැමිණිලි විභාගය තියෙන්නෙ අද. මම දැන් උදේ එනගමන් පොලීසියට ගිහිල්ලා කියලා ආවේ විභාගයට හවසට එනවා කියලා. ඔය ගිනි තිබ්බාය කියන දවසේ මම හිටියෙ අපේ පතිනායක මන්ත්‍රීතුමාලගෙ ගෙදර. එදා අපේ කණ්ඩායම් රැස්වීම තිබුනෙ පතිනායක මන්ත්‍රීතුමාලගෙ ගෙද මම ඒ සඳහා සහභාගි වෙලා හිටියෙ මම මේ කතාව කිව්වෙ විශේෂයෙන්ම මේක වාර්තාගත වෙන්න ඕන නිසා.

ඒවගේම ගරු සභාපතිතුමනි, ධනංජය මන්ත්‍රීතුමා කිව්වා වගේ වතු කම්කරු මහත්වරුන්ට පාලන අධිකාරියෙන් විශාල ලෙස තාඩන පීඩන සිදු කරනවා. කටුපොල් ආශ්‍රිතව සේවය කරන කම්කරුවන්ට ගොඩක් ප්‍රශ්න තියෙනවා. මම ඊයෙ දවසෙ දකුණු පළාත් සභා හිටපු නියෝජ්‍ය සභාපති සම්පත් අතුකෝරල මැතිතුමා සමඟ හෝමදොලවත්තේ ප්‍රධාන කාර්යාලයට ගිහිල්ලා පාලන අධිකාරියත් සමඟ මේ වතු කම්කරු ප්‍රශ්න සම්බන්ධව සාකච්ඡා කරලා, යම් යම් ගැටළු සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කළා. ඇත්තටම ඒ පිළිබඳ සතුටුයි. ඒ පිළිබඳවත් සිහිපත් කරමින් සියළු දෙනාටම තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. 2020 ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, මේ මස 23 වෙනිදා කැටගොඩ අභිනවාරාමයේ චෛත්‍යයට කොත් පැළදවීමේ උත්සවය තියෙනවා. මේ දවස්වල තියෙන කාලගුනයත් එක්ක ඒ ප්‍රදේශයේ ජල හිඟයක් තියෙනවා. මේ අවස්ථාවට විශාල පිරිසක් සහභාගී වීමට නියමිතයි. විශේෂයෙන්ම මේ උත්සවය සඳහා ස්වාමීන් වහන්සේලා විශාල ප්‍රමාණයකට ආරාධනා කරලා තියෙනවා. ඒ වගේම මේ චෛත්‍යය ඉදිකිරීමට බරපැන දරපු ලාල් මහතා ඔහු නියෝජනය කරන සිංහ සමාජයේ සාමාජික සාමාජිකාවන්ටත් මේ අවස්ථාවට සහභාගී වීමට ආරාධනය කරලා. ඒ වගේම 23 දින රාත්‍රියේදීත් පිරිත් ධර්ම දේශනයකුත් පැවැත්වෙන නිසාත්, පංසලේ ළිඳේ පවතින වතුර ප්‍රමාණය ප්‍රමාණවත් නොවෙන නිසාත් 22 වෙනිදා සවස පංසලට වතුර බවුසරයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා දැන් සතුටුද කියලා ඇහුවා. උත්තරය ඔව්. මොකද දැන් අපේ ජනාධිපතිකෙනෙක් ඉන්නවා. ඒ වගේම අපේ ආණ්ඩුවක් තියෙනවා. ඉතින් අපට හරි සතුටුයි. ඉදිරියෙදි අපි ජනතාවට සහන සලසලා මේ රට සුබිත මුදිත තැනකට අරගෙන යනවයි කියන එකත් මතක් කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. පළමුවෙන්ම ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට සුභ නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීවරු දීර්ඝ ලෙස අදහස් දක්වපු නිසා මම කෙටියෙන් කරුණු දෙකක් ගැන කියන්න තමයි අවස්ථාව ලබාගත්තෙ. ගරු සභාපතිතුමනි, කුරුපනාව තේ කර්මාන්තශාලාව පාරෙ වැලි සෝදන තොටුපලක් තියෙනවා. මේ තොටුපලේ වැලි පටවගත්තු වාහන නිතර කුරුපනාව තේ කර්මාන්ත ශාලාව මාර්ගයේ ගමන් කරන නිසා ඒ පාර දැන් විශාල ලෙස අබලන් වෙලා, වලවල් හැරිලා, බොක්කුවකුත් ගිලා බැහැලා තියෙනවා. මේ වන විට මේ පාරේ ගමන් කිරීමට ඉතා අපහසු තත්වයක පවතිනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, තාක්ෂණ නිලධාරියකු යොදවලා මේ සම්බන්ධව සොයා බලා වාර්තාවක් ලබා ගෙන හැකි ඉක්මණින් පියවරක් ගන්න කියලා මම ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ වීථි පහන් පිලිබඳව පසුගිය සභා වාරයේදී මම කතා කළා. ඔබතුමා අපේ ප්‍රදේශයේ වීථි ලාම්පු සවි කලාට, ඒවායින් වැඩි ප්‍රමාණයක් ක්‍රියාකාරි තත්වයේ නැහැ. ඒ නිසා ඒ පිලිබඳව ඔබතුමා වීථි ලාම්පු ටික සකස් කරලා දෙන්න කියලත් මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. මම මීට වඩා කතාකරන්න බලාපොරොත්තුවෙන්නෙ නැහැ. ඔබ සියළු දෙනාට ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම ලැබුවා වූ 2020 නව වසර ඔබ සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. මුලින්ම කියන්න ඕන. අප ප්‍රදේශයේ කුඹුරු බොහොම වෙහෙස මහන්සි වී වගා කළා. මේ දිනවල ගොයම පීදීමට ආසන්නව තියෙනවා. එහෙත් පසුගිය සභාවාරයේදී ගවයින්ගෙන් වන හානිය පිළිබඳව මා සඳහන් කළා. එහෙත් මේ වන තෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කර නැහැ. ඒ පිළිබඳව මම නැවත වාරයක් සිහිපත් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම නගරය පිරිසිඳු කරන පුද්ගලයා සෑම දිනකම නගරය පිරිසිඳු කර එකතුවන කැලිකසළ බස් නැවතුම්පොළේ ඇති ජලය ලබා ගන්නා සභාවේ ළිඳ ආශ්‍රිතව එකතු කර තබනවා. පසුගිය කාලයේ නගරය පිරිසිඳු කර එකතුවන කැලිකසළ සභාවට අයත් ක්‍රීඩාංගණයේ එහා කෙලවරේ එකතුකර තබා රැගෙන යාම සිදු කරනවා. එබැවින් මේ ළිඳ ආශ්‍රිතව කැලි කසළ එකතු කර තැබීම පිළිබඳව සොයා බලා එම කටයුත්ත නැවැත්වීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

මේ දිනවල රජයේ රැකියා ලබා දෙන බවට ගෙන යන ප්‍රචාරණය නිසා අප ප්‍රදේශයේ තරුණ තරුණියන් විශාල ප්‍රමාණයක් එම අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල පෝලිමේ සිටීම දක්නට ලැබෙනවා. මේ කටයුත්ත ඉදිරි මැතිවරණ සඳහා තරුණ පිරිස රැවටීමක් බව ජනතාව සඳහන් කරනවා. ඒවගේම මේ දිනවල වෙළඳපලේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිළ ජනතාවට දරා ගැනීමට නොහැකි ආකාරයෙන් ඉහළ ගොස් තියෙනවා. මෙම රජය විවිධ පොරොන්දු ලබා දී බලයට පත් වුවත්, දැන් ජනතාවට එදා වේල පිරිමහගන්න බැරි තත්වයක් උදා වෙලා. පසුගිය රජය කාලයේ ජනතාව මේ ආකාරයෙන් පීඩාවට පත්වුනේ නැහැ. ඒ බවත් සිහිපත් කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමාගෙන් සහ සමස්ථ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. 2020 ලැබුවා වූ නව වසර ඔබ සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා. ගරු සභාපතිතුමනි, කටුපොල් ප්‍රශ්නය වගේම තවත් කරුණු කාරනා දීර්ඝ වශයෙන් අපේ මන්ත්‍රීවරුන් කතා කරපු මේ අවස්ථාවෙ මම දීර්ඝව කරුණු ඉදිරිපත් කරන්න යන්නෙ නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම කිව යුතු කාරනයක් තියෙනවා. අපේ ප්රාදේශීය සභා බල ප්‍රදේශයේ විවිධ ස්ථානවල ඉඩම් වෙන්දේසි සිදු කරනවා. එම වෙන්දේසිවලින් ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායම් ප්‍රමාණයක් තියෙනවා. ඒ ආදායම නිසි අයුරින් ලබාගන්නවද කියන එක නම් මම දන්නෙ නැහැ. මම ඉල්ලා සිටින්නෙ එහෙම වෙන්දේසි කරන ඉඩම්වලින් සභාවට ලැබිය යුතු ආදායම් හා ඉඩම් කොටස් නිසියාකාරව ලබාගන්න කියන එකත් මම මේ අවස්ථාවෙදි මතක් කර සිටිනවා.

ඒවගේම චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා, එතුමගේ කතාවේදී හාල් මිළ ගැන, එළවළු මිළ ගැන සඳහන් කළා. සමහර විට මන්ත්‍රීතුමාට අමතක ඇති 2015 අපි ඔබතුමාලට භාර දුන්නෙ සහලින් ස්වයංපෝෂිත රටක්. වී අතිරික්තයක් තිබුණා. මත්තල ගුවන් තොටුපලේ පවා වී ගබඩා කළා. එවැනි ගොවි ජනතාවක් අතරමං කරලා, මේ තත්වයට රට ඇදලා දැම්මෙ එක්සත් ජාතික පක්ෂය කියලා මම කියනවා. එළවළු මිළ වැඩි නිසා සහබන්දු මන්ත්‍රීතුමා කියනවා කොස් කොළ, ක්‍රෝටන් කොළ කන්න කියලා. නමුත් අපේ කාලයේ හැම ගෙදරකටම එළවළු ඇට පැකට් ලබාදීලා මිනිස්සු වස විෂ නැතිව වගාකරගෙන කෑවා. තමුන්නාන්සේලට දැන් ඒවා අමතකයි. මම වැඩිදුර ඒ ගැන කතා කරන්න යන්නෙ නැහැ. අවසාන වශයෙන් මම කියන්නෙ තව මාස 06 කින් රට ස්වයංපෝෂිත කරලා, තමුන්නාන්සේලගෙ ගෙවල්වලටත් එළවළු ඇට පැකට් ලබා දෙනවා. ලගදිම පුරං කුඹුරු සියල්ල අස්වැද්දීම කරනවා. බිත්තර වී, පොහොර නොමිලේ ලබාදෙන්නත් බලාපොරොත්තු වෙනවා. ඒවගේම වාරිමාර්ග සංවර්ධනය කරලා දෙනවා. ගොවියා රජ කරන යුගයක් ඉදිරියේදී ඇති කරන බවත් මතක් කරමින් මම නිහඬ වෙනවා. ඔබ සියළු දෙනාට ස්තූතියි.

**ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනී, ගරු මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියනි, ලැබුවා වූ නව වසර සියළු දෙනාට වාසනාවන්ත නව වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, සභාව අමතා අදහස් දක්වන ලදී.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු මන්ත්‍රීතුමියනි, මම පළමුවෙන්ම ගරු උප සභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියළු දෙනාටම ලැබුවා වූ 2020 වර්ෂය සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. පසුගිය වර්ෂවල සිදු වූ අඩුපාඩු ඉදිරි වර්ෂවල සිදු නොවීමට කටයුතු කරමින්, පළාත් සභාවෙන්, මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන ලබා ගෙන ප්‍රදේශයට, ජනතාවට උපරිම අයුරින් සේවය කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු රංජිත් ජයවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු තල්ගස්වල සිට මාපලගම මාර්ගය අයිනේ කුඹුරු ගොඩකිරීම පිළිබඳව සොයා බැලුවා. ඒකෙදි දැනගන්න ලැබුනෙ ඒ ඉඩම ඔප්පු සහිත ඉඩමක්. ඒ

නිසා අපට ඒ සඳහා මැදිහත් වෙන්න හැකියාවක් නැහැ. ඒ වගේම කටුපොල් කර්මාන්ත ශාලාවට ප්‍රාදේශීය සභාවෙන් පරිසර බලපත්‍ර නිකුත් කිරීම මේ වෙනකොට සිදුවෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඥාතිවරයාගේ මළගෙදර පිළිබඳ දැන්වූ විට මම ලයිට් හදන්න කාර්මික නිලධාරී සමඟ වාහනය යැව්වා. නමුත් ඔබතුමා කියන විදියට මළ ගෙවල්වලට ලයිට් හයි කරන එක ප්‍රාදේශීය සභාවේ වගකීමක් නෙවෙයි. අපි ඒ කටයුත්ත කරන්නෙ සානුකම්පිතව සළකලා.

ඒ වගේම සමන් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි උඩුගම පෙරහැරේ කටයුතු ප්‍රාදේශීය සභාවේ තිබෙන සම්පත් ප්‍රමාණය අනුව අපට කරන්න පුළුවන් ප්‍රමාණය කරලා දෙන්නම්. පෙරහැරේ කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවේ වාහන ලබා දීමටත් උත්සාහ කරන්නම්. ඊළඟට පතිනායක මන්ත්‍රීතුමා සඳහන් කල ඌරල පොදු ළිඳ සකස් කර දීමට ඒ අය පොරොන්දු වුණා. තලගහහේන මාර්ගයේ ඉදිකරන බැම්ම සම්බන්ධව තාක්ෂණ නිලධාරී යවලා, වාර්තාවක් ලබාගෙන කටයුතු කරනවා. ඒ වගේම ධනංජය මන්ත්‍රීතුමා ප්‍රකාශ කල උඩුගම සර්ක්ස් සංදර්ශනයේ සිදු වූ සිද්ධිය දැනගත් වහාම මම ඒ පිළිබඳව අදාළ අයට කතා කරලා, වහාම වරද නිවැරදි කරන ලෙස දැන්වුවා. එසේ නොකරනවානම් සංදර්ශනය නතර කරන්න කියලත් කිව්වා.

ගයාන් මන්ත්‍රීතුමා කැටගොඩ පංසලට වතුර බවුසරයක් ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. පංසලට විතරක් නෙමෙයි පාසල්වලිනුත් වතුර බවුසර් ඉල්ලුම් කරලා තියෙනවා. මේ සේරම ඉල්ලන්නෙ නොමිලේ. මේ දවස්වල බවුසර්වලට වතුර පුරවගන්නත් අමාරුයි. කොහොම නමුත් ඒ ඉල්ලීම ඉටු කරන්න උත්සාහ කරන්නම්. ඒ වගේම අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය ප්‍රකාශ කල කුරුපනාවේ පවත්වා ගෙන යන වැලි පොළ සම්බන්ධව සොයා බලන්නම්, ඉදිරි කටයුතු සඳහා සභාවෙ පරිසර නිලධාරි දැනුවත් කරනවා. එහෙමනම් මම වැඩිදුර කතාකරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අද දින සභාවේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට සහය දැක්වූ උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා.

සභාපති,
නාගොඩ ප්රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:- ...............................